# ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පී. එල්. සී. හි සියලුම කොටස් හිමියන් වෙත කරනු ලබන දැනුම්දීමයි.

2023 ජුනි 28 වැනි දින පෙ.ව. 10.00 ට ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට නියමිත සමාගමේ 19 වැනි

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳව කරනු ලබන දැනුම් දීමයි.

ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පීඑල්සී හි කොටස් හිමියන්ගේ දහනවවැනි වාර්ෂික මහා සභා රැස්වීම පහත කාර්යයන් සපුරාලීම සඳහා 2024 ජුනි 28 වැනි දින පෙ.ව. 10 ට ඔන්ලයින් රැස්වීමක් ආකාරයෙන් පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ:

**න්‍යාය පත්‍රය**

1. සාමාන්‍ය කටයුතු

1.1 රැස්වීම පිළිබඳ දැනුම්දීම

1.2 අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව සහ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ගිණුම් ප්‍රකාශයන් අදාළ විගණකවරුන්ගේ වාර්තාව සමඟ පිළිගැනීම සහ සලකා බැලීම.

1.3 2024 මැයි 29 වන දින ප්‍රකාශයට පත් කරනු ලැබ, 2023/2024 මූල්‍ය වර්ෂයේ ලාභයෙන් කොටස් හිමියන්ට ගෙවනු ලැබූ රු. 0.60 ක අතුරු ලාභාංශය එකී මූල්‍ය වර්ෂය සඳහා වන අවසාන ලාභාංශය ලෙස සැලකිය යුතු බව සම්මත කර ගැනීම.

1.4 සමාගම් ව්‍යවස්ථාවේ 29(1)(අ) වගන්තිය ප්‍රකාරව පතිරගේ අනුර විජේසිරි පෙරේරා මහතා නැවත අධ්‍යක්ෂකවරයකු ලෙස පත් කිරීම

1.5 ඉදිරි වසර සඳහා සමාගමේ විගණකවරුන් ලෙස Messrs' BDO Partners (වරලත් ගණකාධිකාරීවරුන්) නැවත පත් කිරීම සහ ඔවුන්ගේ වේතනය තීරණය කිරීමට අධ්‍යක්ෂකවරුන්ට බලය පැවරීම.

1.6 2024/25 වසර සඳහා පුණ්‍ය කටයුතු සහ වෙනත් පරිත්‍යාග වෙනුවෙන් වන දායක මුදල් තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරීම.

**2. විශේෂ කාර්යයන්**

කොළඹ කොටස් වෙළඳපොලේ වත්මන් ලැයිස්තුගත වීමේ නීති රීතිවලට අනුකූල වනු පිණිස , සමාගම් ව්‍යවස්ථාවේ වගන්ති සංශෝධනය කිරීම සඳහා විශේෂ යෝජනාවක් ලෙස පහත යෝජනාව සලකා බැලීම සහ සුදුසු යැයි හැඟෙන්නේ නම් සම්මත කිරීම:

"පවතින 30 වැනි වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කර ඒ වෙනුවට 30 වැනි වගන්තිය ලෙස පහත වගන්තිය ආදේශ කිරීම විශේෂ යෝජනාවක් ලෙස මෙයින් සම්මත කරගනු ලැබේ.

**30. විකල්ප අධ්‍යක්ෂ**

(1) සුවිශේෂී අවස්ථා වලදී, ලියාපදිංචි කාර්යාලයේ සිටින ඕනෑම අධ්‍යක්ෂකවරයෙකුට, ලිඛිත දැනුම් දීමක් සිදු කිරීම මගින් පහත (2) හි දක්වා ඇති නිර්ණායක සපුරාලන පුද්ගලයෙකු ඔහු/ඇය වෙනුවෙන් වැඩ බැලීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම අනුමත කළ හැකි අතර එලෙස පත් කරනු ලැබූ ඕනෑම පුද්ගලයෙකුට මෙම ව්‍යවස්ථාවේ සඳහන් පහත විධිවිධාන අදාළ විය යුතුය.

(අ) විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලද තැනැත්තෙකුට, එවැනි පත්වීමක් සම්බන්ධයෙන්, ඔහු/ඇය විසින් ඔහු/ඇය වෙත එවන් දැනුම්දීමක් ලබා දීමෙන් හැර මෙම පත්වීමේ යම් වරප්‍රසාද හෝ හිමිකම් සඳහා පමණක් හිමි නොවේ/ ඔහු/ඇය පත් කරන අධ්‍යක්ෂවරයා පුද්ගලිකව නොපැමිණෙන සහ සාමාන්‍යයෙන් සියලුම කාර්යයන් ඉටු කිරීම සඳහා එවැනි ඕනෑම මණ්ඩල රැස්වීමකට හෝ අනුකමිටු රැස්වීමකට සහභාගී වී අධ්‍යක්ෂක ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට අධ්‍යක්ෂවරුන්ගේ සහ සමාගමේ සියලුම රැස්වීම් පිළිබඳ දැනුම්දීම් ලැබීමට ඔහුට/ඇයට හිමිකම් ඇත. අධ්‍යක්ෂවරුන් සහ/හෝ ඔහුගේ/ඇයගේ පත් කරන්නා විසින් පනවා ඇති සීමාවන්ට යටත්ව එවැනි අධ්‍යක්ෂවරයෙකු නොමැති අවස්ථාවක ඔහු/ඇය පත් කළ අධ්‍යක්ෂවරයා එවැනි ඕනෑම රැස්වීමකට විකල්ප අධ්‍යක්ෂවරයාගේ පැමිණීම ගණපූරණය පැමිණ සිටීමේ අරමුණ සඳහා ගණන් කළ යුතුය.

(ආ) පත් කළ දින සිට වසරක (01) කාල සීමාවක් නොඉක්මවන, නිශ්චිත කාලසීමාවක් සඳහා හෝ නිශ්චිත සිදුවීමක් සිදු වන තෙක් විකල්ප අධ්‍යක්ෂවරයකු පත් කළ හැකි අතර පහත සඳහන් යම් සිදුවීමක් හෝ කිහිපයක් සිදු වුවහොත් ඔහු/ඇය තවදුරටත් විකල්ප අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කිරීම අවසන් කළ යුතුය, එනම් : -

(i) විකල්ප අධ්‍යක්ෂකවරයාගේ පත්වීම ඔහු/ඇය පත් කරන අධ්‍යක්ෂකවරයා විසින් සමාගමේ කාර්යාලයේ තබා ඇති ලිඛිත දැනුම්දීමක් මගින් අවලංගු කරන්නේ නම්; හෝ

(ii) විකල්ප අධ්‍යක්ෂවරයාගේ පත්වීම අවසන් කළ යුතු බවට අධ්‍යක්ෂවරුන් තීරණය කරන්නේ නම්, එසේ කළ යුතු වන මුත් අධ්‍යක්ෂවරුන්ගේ එවැනි යෝජනාවක් නිකුත් වූ දින සිට දින 30ක් ඉකුත් වන තුරු එම අවසන් කිරීම බලාත්මක නොවිය යුතුය;

(iii) පත් කිරීම සිදු වන්නේ නියමිත කාලසීමාවකට අදාළව හෝ නිශ්චිත සිදුවීමක් සිදු වූ විට නම්, නියමිත කාල සීමාව අවසානයේ හෝ එවැනි නිශ්චිත සිදුවීමක් සිදු වන විට ;

(iv) පනතේ 202 වගන්තියට අනුව අධ්‍යක්ෂවරයකු වීමට නුසුදුසු නම් ; හෝ

(v). පත් කරනු ලැබූ තැනැත්තා ඉල්ලා අස් වේ හෝ මිය යයි නම්.

(2) විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම පහත සඳහන් කරුණු වලට යටත් විය යුතුය.

(අ) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් සමාගමේ විධායකයෙකු ඔහුගේ/ඇයගේ විකල්පය ලෙස පත් නොකළ යුතුය.

(ආ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් පත් කරන ලද විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලැයිස්තුගත කිරීමේ රීති මගින් නිශ්චිතව දක්වා ඇති ස්වාධීනත්වයේ නිර්ණායක සපුරාලිය යුතු අතර සමාගම විසින් එකී රීතිවල දක්වා ඇති අවම ස්වාධීන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවට අදාළ අවශ්‍යතා සපුරාලිය යුතුය. නාමයෝජනා සහ පාලන කමිටුව විසින් එවැනි පත්කිරීමක් සිදුකිරීමට පෙර විකල්ප වශයෙන් නම් කරන ලද පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස සුදුසුකම් ලබන බව සමාලෝචනය කර තීරණය කළ යුතුය.

(3) එවැනි නිවේදනයක් සඳහා ලැයිස්තුගත කිරීමේ රීති මගින් නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා ඇතුළත් කරමින් විකල්ප අධ්‍යක්ෂවරයා පත් කිරීම සම්බන්ධයෙන් සමාගම වහාම වෙළඳපල නිවේදනයක් නිකුත් කළ යුතුය.

**2023/24 වාර්ෂික වාර්තාවේ පිටපත්**

වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපත, ඉල්ලුම් කළ දින සිට වෙළඳපොළ දින අටක් (8) ඇතුළත, නියමිත පෝරමය භාවිතයෙන් ලිඛිතව ඉල්ලා සිටින සාමාජිකයින්ට පමණක් ලබා දෙනු ඇත.

සියලුම කොටස් හිමියන්ට වාර්ෂික වාර්තාවට සමාන ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම සඳහා සහ කිසිදු අගතියකින් තොරව වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී විය හැකි බව සහතික කිරීම සඳහා, රැස්වීම් දැනුම්දීම සහ අදාළ ලේඛන CSE වෙබ් අඩවියෙන් (https://www.cse.lk/pages/company-profile/company-profile.component.html?symbol=PLR.N0000 සහ අපගේ ආයතනික වෙබ් අඩවියෙන් ද දැනගත හැක (https://www.primeresidencies.lk/investor-relation) මෙම ලේඛනවල ඔන්ලයින් තාක්ෂණය හරහා වාර්ෂික මහා සභා රැස්වීමට (AGM) සහභාගි වීමට අදාල මාර්ගෝපදේශ සහ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය, වාර්ෂික මහ සභා රැස්වීම සඳහා ඔන්ලයින් ක්‍රමයට සහභාගි වීමට කොටස් හිමියන්ගේ විස්තර ලියාපදිංචි කිරීම (ලියාපදිංචි කිරීමේ පෝරමය) සහ 2023/24 වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපත් ඉල්ලීම්කිරීමේ පෝරමය ඇතුළත් වේ.

ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පීඑල්සී
අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි

S S P Corporate Services (Private) Limited
(අත්සන් කරන ලදී)
සමාගම් ලේකම්වරු
දිනය : 2024 ජුනි 04

PRIME RESIDENCIES